**චාමර සම්පත් එ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/719/2018 (2019.02.12 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| **කොමිෂන් සභා සමාජික:** | විනිසුරු රෝහිණී වල්ගම |

**අධ්‍යක්ෂ -ජනරාල්:** පියතිස්ස රණසිංහ

**අභියාචක** - චාමර සම්පත්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**පෙනීසිටීම**

අභියාචක - චාමර සම්පත්
පොදු අධිකාරිය - ටිකිරි කේ ජයතිලක, සහකාර මහ ලේකම්
පී කේ ඩී එස් ඩබ්ලිව් විජේගුණතිලක

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.06.21 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.08.21 |
| නම් කළ නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.08.30 |
| නම් කළ නිළධරයා තීරණය ලබා දුන් දිනය | 2018.09.07 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.09.11 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.06.21 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. *2018 වර්ෂයේ තම වත්කම් සහ බැරකම් ප්‍රකාශයන් ඉදිරිපත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගණනයක ලිඛිත ප්‍රකාශනයක්.*

2. *2010 වර්ෂයේ සිට මේ වන තෙක් වත්කම් සහ බැරකම් ප්‍රකාශනයන් ඉදිරිපත් කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුවක්.*

තොරතුරු නිලධාරියා 2018.08.21 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ආශ්‍රිතව වත්කම් සහ බැරකම් තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වේ නම් 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය ප්‍රකාරව පාර්ලිමේන්තු කථානායකවරයාට මේ පිළිබඳව ඉල්ලීමක් කළ යුතු බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.08.30 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2018.09.07 දිනැතිව ප්‍රතිචාර දක්වමින් නැවතත් තොරතුරු නිලධාරියාගේ ස්ථාවරය ඉදිරිපත් කළ අතර, 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ 11 වන වගන්තිය ප්‍රකාරව, මෙම පනත වෙනත් පනතක් සමඟ අනානුකූලතාවයක් ඇති වූ විට 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය බලපැවැත්වෙන බවද ඉදිරිපත් කරන ලදී. මෙම තීරණයෙන්ද අභියාචක සෑහීමකට පත් නොවූ හෙයින් 2018.09.11 දිනැතිව අභියාචක කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක විසින් තම තොරතුරු ඉල්ලීම මඟින් සංඛ්‍යානමය තොරතුරු පමණක් ඉල්ලීම් කර ඇති බවත්, ඔහු තම ඉල්ලීම මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වත්කම් සහ බැරකම් ප්‍රකාශයන්හි අන්තර්ගතය විමසා නොමැති බැවින් තොරතුරු පනත ප්‍රකාරව තමා හට මෙම තොරතුරු ලබාගැනීමට හැකියාවක් ඇති බවත් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙයට ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද 2019.02.05 දිනැති ලිඛිත දේශනය ගෙනහැර පෙන්වූයේ අභියාචක විසින් ඉල්ලීම් කරන ලද තොරතුරු 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ විෂය පථයට යටත් වන බැවින්, එම නීතිය ප්‍රකාරව එවැනි තොරතුරු ඉල්ලීමක් පාර්ලිමේන්තු කථානායකවරයාට ඉදිරිපත් කළ යුතු බවය. තවද, මෙම තොරතුරු ඉල්ලීම සිදු කර ඇති ක්‍රියාන්වලිය හරහා අභියාචක විසින් වක්‍රාකාරව පාර්ලිමේන්තු වරප්‍රසාදයන් උල්ලංඝනය කරන බැවින් ඔහුට මෙම තොරතුරු අවශ්‍ය වන්නේ නම් එම ඉල්ලීම වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ ක්‍රියා පටිපාටියට අනුකූලව සිදු කරන මෙන් ප්‍රකාශනය කරන ලදී.

මෙහිදී අභියවක විසින් ඔහුගේ තොරතුරු ඉල්ලීම සංඛ්‍යානමය තොරතුරු ඉල්ලීමක් බැවින් එම දත්ත ප්‍රකාශනය කිරීමෙන් කිසිදු හානියක් පාර්ලිමේන්තුවට හෝ වෙනත් මන්ත්‍රණ සභාවකට නොවන බවට ඉදිරිපත් කරන ලදී. පොදු අධිකාරිය විසින් තවදුරටත් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එය තොරතුරු පනත ප්‍රකාරව සිදු කළ යුතු බවට අභියාචක කොමිෂන් සභාව ඉදිරියේ පෙන්වා දෙන ලදී. මෙයට පිළිතුරු වශයෙන් පොදු අධිකාරිය ප්‍රකාශ කර සිටියේ පාර්ලිමේන්තු පරිපාලන අංශයට කිසිදු ආකාරයකින් කථානායකවරයාට නියෝගයන් නිකුත්කළ නොහැකි බවය. තවද, මෙහිදී පැන නැගී ඇති අවස්ථාවට තොරතුරු පනත ක්‍රියාත්මක නොවන බැවින් ලිඛිතව තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමේ හේතු කාරනා දැක්වීමට අවශ්‍යතාවය නොමැති බව පෙන්වා දක්වන ලදී.

**නියෝගය:**

පොදු අධිකාරිය විසින් තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරන්නේ නම් එය <u>සාධාරණීකරණය</u> කිරීම තොරතුරු පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව තොරතුරු වලට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීමට හේතු පෙන්වා දෙමින් සිදු කළ හැකිය.

තවද, තොරතුරු සැපයීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ප්‍රථමව, තොරතුරු පනතේ 3(1) වන වගන්තිය ප්‍රකාරව, පොදු අධිකාරිය විසින් එම තොරතුරු තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති බව තහවුරු කර ගත යුතු වේ.ඇතිබව එබැවින්, තොරතුරු පනතේ 3(1) වගන්තියට අනුකූලව මෙම තොරතුරු තම සන්තකයේ තිබේද හෝ නොතිබේද යන්න පැහැදිලි කොට, තොරතුරු ඇත්නම්, පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව, ලබා දීම ප්‍රතික්ෂේප කරන හේතු ගෙනහැර දැක්වීම ලිඛිත දේශනයක් ඔස්සේ ඉදිරිපත් කරන ලෙසට පොදු අධිකාරියට මෙයින් නියෝග කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම් දිනය: 2019.05.21

---

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/719/2018 (2019.05.21 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| **කොමිෂන් සභා සමාජික:** | විනිසුරු රෝහිණී වල්ගම |

| | | |
|---|---|---|
| **අභියාචක** | **-** | චාමර සම්පත් |
| **නොතිසි ලත් පාර්ශවය** | **-** | නම්කළ නිලධාරි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව |

**පෙනීසිටීම**

| | | |
|---|---|---|
| අභියාචක | - | පැමිණ නැත |
| පොදු අධිකාරිය | - | ටිකිරි කේ ජයතිලක, සහකාර මහ ලේකම් |
| | | පී කේ ඩී එස් ඩබ්ලිව් විජේගුණතිලක |

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක පැමිණ නැත. පොදු අධිකාරිය විසින් තම 2019.05.21 දිනැති ලිඛිත දේශනය භාර දෙන ලදී. තම ලිඛිත දේශනය ඔස්සේ අභියාචක විසින් ඉල්ලීම් කරන ලද තොරතුරු තොරතුරු පනතේ 3 (1) උපවගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති ද බව පොදු අධිකාරිය විසින් ප්‍රකාශ කරන ලදී.

**නියෝගය:**

මෙම නියෝගය ලැබීමෙන් සති දෙකක් කාලයක් තුළදී පොදු අධිකාරිය ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයට සමගාමීව ප්‍රතිචාරයක් ලිඛිත දේශනයක් ඔස්සේ ඉදිරිපත් කරන මෙන් අභියාචකට මෙයින් නියෝග කරනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.

*****

RTIC Appeal (ලේඛනගත කාර්යපටිපාටිය)/719/2018 (2019.06.25 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - චාමර සම්පත්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය විසින් තම ලිඛිත දේශනය ඔස්සේ තම ස්ථාවරය වන ඉල්ලීම් කර ඇති තොරතුරු තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ නොමැති බව තහවුරු කිරීම සඳහා තර්කයන් දෙකක් ගෙනහැර දක්වා ඇත. ඒවානම්:

1. මෙම තොරතුරු ඉල්ලීමට සමගාමීව තොරතුරු පනතට ඇති බලතලයන් සීමිත වීම
2. ගරු කථානායකවරයාගේ කාර්යාලයේ සහ පාර්ලිමේන්තු මහා ලේකම් කාර්යාලය යන අංශයන් දෙකෙහි ක්‍රියාකාරිත්වයේ වෙනස

<u>**තොරතුරු ඉල්ලීමට සමගාමීව තොරතුරු පනතට ඇති බලතලයන් සීමිත වීම**</u>

1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ 11 වන වගන්තිය සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වැනි වගන්තිය එක හා සමාන වන අතර මෙම වගන්ති වලින් ප්‍රකාශිත වනුයේ, මෙම පනත් වලට පටහැනිව වෙනත් යම් ලිඛිත විධිවිධානවලට කුමක් සඳහන් වුවත්, මෙම පනත්වල විධිවිධාන බලාත්මක වන බවයි.

තවද, 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ පූර්විකාවේ සඳහන් වන පරදී මෙම නීතියට යටත් වන්නාවූ නිශ්චිත පුද්ගලයින් කොට්ඨාශය විසින් තමාට ශ්‍රී ලංකාව තුල සහ ඉන් පිටත ඇති සම්පූර්ණ වත්කම් හා බැරකම් සම්බන්ධව කාලානුරූපී ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එබැවින් මෙය විශේෂයන් හඳුන්වන ලද පුද්ගලියින් කොට්ඨාශයට පමණ ක් අදාළ වන විශේෂිත වූ නීතියක් වේ. .

අර්ථ නිරූපණ නීතියේ "*genarally specialibus non derogant*" ආප්තයෙන් ගම්‍ය වන්නේ ව්‍යතිරේකයෙන් සාමාන්‍ය පනතක් විශේෂිත පනතකට යටත් වන බවයි. එම නිසා 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ 8(1) වගන්තියේ සඳහන් වන රහස්‍යභාවය සුරැකීම යන විශේෂ වගකීම මගින් තොරතුරු පනතට අනුකූලව පොදු අධිකාරීන්ට ඇති සාමාන්‍ය වගකීම් අභිභවනය වේ.

ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය මගින් හඳුන්වා දුන් 14අ ව්‍යවස්ථාව ප්‍රකාරව සෑම පුරවැසියෙකුටම 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ඔස්සේ පොදු අධිකාරියක් මගින් රඳවා තබා ගෙන ඇති තොරතුරු ලබා ගත හැකි බව ස්ථාපිත කර ඇත. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ පූර්විකාව මගින් ව්‍යවස්ථාවේ 14අ වැනි ව්‍යවස්ථාව සමග ඇති සෘජු සම්බන්ධතාවය පෙන්නුම් කරනු ලැබේ. එම නිසා එකී පනතේ වගන්ති තනිව කියවිය යුතු හෝ අර්ථකථනය නොකළ යුතු අතර ව්‍යවස්ථාවේ 14අ වැනි ව්‍යවස්ථාව සමඟ එකට කියවිය යුතුය. තවද 14අ(2) වැනි අනුව්‍යවස්ථාව මගින් එකී පනතේ සීමාවන් සඳහන් වේ.

තවද ව්‍යවස්ථාවේ 16(1) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව "*පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති අතුරෙන් යම්කිසි ලිඛිත නීතියක් සහ ලිඛිත නොවූ නීතියක් මේ පරිච්ඡේදයේ මෙයට ඉහතින් ඇති විධිවිධානවලට අනුකූල නොවූවද, එකී සියලු පවත්නා ලිඛිත නීති හා ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන්නේය*" යන්නෙන් සඳහන් වන බැවින් 14අ වැනි ව්‍යවස්ථාව හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතද එකී 16වැනි ව්‍යවස්ථාවට යටත් වනු ලැබේ.

1975 වසරේදී වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය සම්මත කළ අතර, එකී පනතේ වගන්ති, ව්‍යවස්ථාවේ 14අ වැනි ව්‍යවස්ථාව සමඟ විරෝධී වීමේ ලක්ෂණ යම්තාක් දුරට පෙන්නුම් කරනු ලැබේ. ඉහත කරුණු සළකා බැලීමේදී පෙනී යන්නේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ වගන්තින් ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථාව මඟින් බලාත්මක වන බවයි.

ව්‍යවස්ථාවේ 14අ (2) අනුව්‍යවස්ථාවේ සඳහන් පුරවැසියෙකුගේ තොරතුරු දැනගැනීමේ අයිතිය පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සඳහා සීමා කළ හැකිය. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(2) වගන්තිය මගින් මෙම සීමාව වඩාත් පුළුල් ලෙස විස්තර කරන අතර මෙම පනතේ වගන්ති මගින් පාර්ලිමේන්තුවේ බලතල, වරප්‍රසාද හා ප්‍රතිපත්ති අපහාසයට ලක් නොකරන බව ප්‍රකාශිත වේ.

පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත, ව්‍යවස්ථාවේ 67 වන ව්‍යවස්ථාව සමඟ සම්බන්දව ඇති අතර එමගින් "පාර්ලිමේන්තුවේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නිශ්චය කොට විධිමත් කළ හැකි අතර, එසේ නිශ්චය කොට විධිමත් කරන තෙක් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සම්බන්ධයෙන් අදාල වන්නේය." එබැවින් මෙම පනතට ව්‍යවස්ථාමය සහතිකයක් ලබා දී ඇත.

ඉහත සඳහන් කළ කරුණු හා පාර්ලිමේන්තු සම්මුතීන් හා පිළිවෙත් මඟින්, ඉල්ලා ඇති තොරතුරු නිදහස් කිරීමට මහ ලේකම්වරයාට බලය නැත. වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියට අනුව විධිමත් ඉල්ලීමක් කථානායක වෙත යොමු කිරීමෙන් අභියාචකයාට ඉල්ලූ තොරතුරු ලබා ගැනීමට බාධාවක් නොමැත.

<u>කථානායකවරයාගේ සහ මහලේකම්වරයාගේ කාර්යාලවල ක්‍රියාකාරිත්වය අතර වෙනස</u>

පාර්ලිමේන්තුවේ කථානායකවරයා පාර්ලිමේන්තුවේ නියෝජිතයා, ප්‍රකාශකයා සහ සභාවේ අවසාන අධිකාරිය වේ. අග්‍රාමාත්‍යවරයා සහ ජනාධිපතිවරයාට පසුව කථානායකවරයා ප්‍රමුඛතා අනුපිළිවෙලින් තුන්වන ස්ථානයේ සිටී. ඔහු සිය බලතල ලබා ගන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ස්ථාවර නියෝග, පාර්ලිමේන්තුව (බලතල හා වරප්‍රසාද) පනත සහ පාර්ලිමේන්තුවේ සම්මුතීන් හා භාවිතයන් මඟිනි. සභාවේ බලතල හා වරප්‍රසාද සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ භාරකරු වන කථානායකවරයා පාර්ලිමේන්තුවට පිළිතුරු දිය යුතු අතර පාර්ලිමේන්තුවේ සියලුම සාමාජිකයන් එතුමාගේ බලතල යටතේ ආරක්ෂා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාව අනුව, පාර්ලිමේන්තුව විසින් කථානායකවරයා 4 වන ස්ථාවර නියෝගයන්ට අනුකූලව තෝරා පත් කර ගත යුතු අතර, ක්‍රියාපටිපාටියට අනුකූලව එය රහස් ඡන්දයකින් සිදු කරනු ලැබේ. 143 වන ස්ථාවර නියෝගයට අනුකූලව අවශේෂ බලතලයන්ද ඔහුට පවරා ඇති අතර, එහි සඳහන් වන ආකාරයට, "මෙම ස්ථාවර නියෝගවල නිශ්චිත වශයෙන් විධිවිධාන සලසා නොමැති සියලු ම කරුණු ද, මෙම නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩි විස්තර සම්බන්ධයෙන් සියලු ම ප්‍රශ්න ද, මෙහෙයවීම් සිදුකරනු ලැබිය යුත්තේ කථානායකවරයා විසින් යෝග්‍ය යැයි සලකනු ලබන ආකාරයට වරින්වර කරනු ලබන නියෝග ප්‍රකාරවය."

පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ගෞරවය ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම කථානායකවරයාගේ වගකීම වේ.

පාර්ලිමේන්තුවේ ස්ථිර නිල කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා වන මහ ලේකම්වරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 සී (1) අනුව්‍යවස්ථාව සහ 65 වන ව්‍යවස්ථාව ප්‍රකාරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ අනුමැතිය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබේ. පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධූරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සුරක්ෂිත වී ඇති නිලයක වන අතර එම තනතුර ධරන්නා කථානායකවරයාගේ ලේකම් නොවේ.

මහ ලේකම්වරයාගේ රාජකාරීන් ස්ථාවර නියෝග අංක 10 න් ප්‍රකාශිත වේ. ඒ අනුව, මහ ලේකම්වරයා විසින් පාර්ලිමේන්තුවේ සහ පූර්ණ පාර්ලිමේන්තුවේ කාරක සභාවල වැඩකටයුතු පිළිබඳ කාර්යය සටහන් සකස් කළ යුතු අතර, මතු කවර දිනකට හෝ නියම කරන ලද සියලු කටයුතු සහ නම් කරන ලද හෝ නොකරන ලද මතු දිනකට තබන ලද ප්‍රශ්න හෝ යෝජනා පිළිබඳ න්‍යාය පුස්තකයක් තබා ගත යුතුවේ. පාර්ලිමේන්තු කාර්ය සටහන්, වාර්තා සහ පාර්ලිමේන්තුවට ඉදිරපත් කරනු ලබන පනත් කෙටුම්පත් සහ අනෙකුත් ලේඛනවල සුරක්ෂිත භාරකාරීත්වය සම්බන්ධයෙන් මහ ලේකම්වරයා වගකිව යුතුවේ. තවද, මහ ලේකම්වරයා විසින් කාරක සභාවල පරිපාලනමය හා සම්පත් සහාය ලබා දීම සඳහා වගකියනු ලැබිය යුත්තේය.

ගරු කථානායකට උපදෙස් නිකුත් කිරීමට මහ ලේකම්වරයාට හැකියාවක් නොමැති අතර පාර්ලිමේන්තුවේ කාර්යයන් ඉටු කිරීමේදී ගරු කථානායකගේ උපදෙස් අනුව කටයුතු කිරීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම් බැඳී සිටියි. එබැවින්, ගරු කථානායකතුමාගේ පාලනය යටතේ පවතින කිසියම් තොරතුරක් නිකුත් කිරීමට එතුමා විසින් උපදෙස් ලබා දෙන්නේ නම්, එවැනි නියෝගයක් අනිවාර්යයෙන් ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තු ලේකම් කාර්යාලය බැඳී ඇත. එහෙත් ගරු කථානායක සහ පාර්ලිමේන්තු මහ ලේකම්වරයා තම රාජකාරීන් ස්වාධීනව ඉටු කරනු ලැබේ.

2012 දී “දිවිනැගුම” කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ගනු ලැබූ තීන්දුව මේ අවස්ථාවේ අවධාණයට ගන්නා අතර, ගරු කථානායක සහ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයන්හි සුවිශේෂී ස්වභාවය හඳුනා ගැනීමේ වැදගත්කම පිළිබඳ මෙහිදී සාකච්ඡාවට භාජනය විය. ඒ අනුව 2012 ඔක්තෝම්බර් 09 වන දින මේ සම්බන්ධයෙන් තීන්දුවක් ලබා දෙමින් පාර්ලිමේන්තු කථානායකවරයා ඉහත කාරණය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවරය ඉදිරිපත් කරන ලදී.

*“කථානායකවරයාගේ බලතලයන් ව්‍යුත්පන්න වනුයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 (1) ව්‍යවස්ථාවෙන්ය. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඔහු තෝරා පත් කර ගනු ලබන අතර ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව කථානායකවරයා ජනාධිපතිවරයාට සහ අගමැතිවරයාට පසුව ප්‍රධාන ධුරයක් හොබවයි. මෙමගින්* පාර්ලිමේන්තුවට සහ කථානායකවරයාට ලබා දී ඇති ස්ථානය පිළිබිඹු වෙයි. *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 (1) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තු මහ ලේකම්වරයා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දරන්නේය. බලය, අධිකාරිය සහ තත්වය යන කරුණු මත කථානායකවරයාගේ සහ මහ ලේකම්වරයාගේ කාර්යාලයන්හි බලතලයන් අනුපමේය වන බැවින් නොතිසි ලැබීම සඳහා සමාන කොට සැලකිය නොහැකිය. තවද පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට ස්ථාවර නියෝග අංක 9 යටතේ සීමිත බලතල ඇති අතර කථානායකවරයාට ඔහුව ආදේශ කළ නොහැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් කථානායකවරයාට සුවිශේෂීව පවරා ඇති බලය කිසිදු කථානායකවරයකු විසින් පාර්ලිමේන්තු මහ ලේකම්වරයා වෙත පවරා නොමැති අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මෙය කළ නොහැක්කකි. කථානායකවරයා පාර්ලිමේන්තුවේ ප්‍රධාන අංගයක් වන අතර එතුමා විසින් පාර්ලිමේන්තුවේ රැස්වීම්වල මුලසුන දරනු ලැබේ. එර්ස්කයින් මැයිට අනුව කථානායකවරයා යනු ‘‘... එහි (පාර්ලිමේන්තුවේ) බලතල, ක්‍රියාමාර්ග සහ ගෞරවය පිළිබිඹු කරන්නාවූ නියෝජිතයා වේ’’. කථානායකවරයා වෙත ඉදිරිපත් වන්නාවූ දැනුම්දීමක් භාර ගැනීමට පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට කිසිදු වගන්තියක්, නීතියක්, රීතියක් හෝ රෙගුලාසියක මඟින් විධිවිධාන ස්ථාපිත කර නොමැත. පාර්ලිමේන්තු මහ ලේකම්වරයා, කථානායකවරයා වෙනුවට ආදේශ කිරීමට නම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ අනුව සංශෝධනය කිරීමට සිදුවනු ඇති අතර එය ව්‍යවස්ථාදායකයාට අදාළ කරුණකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථානුකූලව ජනාධිපතිවරයා විසින් යවනු ලබන ලිඛිත යොමු කිරීමක්, නැතහොත් ශ්‍රේෂ්ඨාධිකරණය අමතා කවර හෝ පුරවැසියෙකු විසින් යවනු ලබන ලිඛිත පෙත්සමක් වෙතොත් ඒ යොමු කිරීමේ හෝ පෙත්සමේ පිටපතක් ඒ අවස්ථාවේ දී ම කථානායකවරයාට භාර දිය යුතු බවත් එවැන්නක් පාර්ලිමේන්තු මහ ලේකම්වරයාටම භාර නොදිය යුතු බවත් මම 2012 ඔක්තෝබර් 9 වන දින තීරණයක් ගනිමි. පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාට එවැනි භාරදීමක් සිදුකළහොත් එවැන්නක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 (1) ව්‍යවස්ථාවට අනුකූලව පාර්ලිමේන්තුව විසින් භාර නොගනී. මෙම තීන්දුවේ පිටපතක් අතිගරු ජනාධිපතිතුමාට සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගරු විනිසුරුවරුන් වෙත යවන ලෙස මම පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට උපදෙස් දෙමි. ”*

1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ 4 (ආ) වගන්තියෙන් දැක්වෙන ආකාරයෙන් කැබිනට් අමාත්‍යවරුන්, අනෙකුත් අමාත්‍යවරුන් සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් හැර සෙසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීම කථානායකවරයාට ඉදිරිපත් කළ යුතුවේ. ඒ අනුව, ඉහත කරුණු සහ ගරු කථානායකවරයාගේ තීන්දුව සලකා බැලීමේදී, කථානායකවරයා සන්තකයේ, භාරයේ හෝ පාලනයේ ඇති තොරතුරු නිදහස් කිරීමට පාර්ලිමේන්තු මහ ලේකම්වරයාට කිසිදු නීතියක් යටතේ බලතලයන් නොමැත.

**නියෝගය:**

පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද තර්කයන් මෙයින් වාර්තාගත කරනු ලැබේ. පොදු අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයට ප්‍රතිචාරයක් 2019.09.10 දිනට හෝ ඊට පෙර දිනයකදී ඉදිරිපත් කරන මෙන් අභියාචකට මෙයින් නියෝග කරනු ලැබේ.

අභියාචනය කල් තබන ලදී.

මීළඟ කැඳවීම් දිනය: 2019.09.10

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*******

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/719/2018 (2019.09.10 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| **කොමිෂන් සභා සමාජික:** | විනිසුරු රෝහිණී වල්ගම |
| **අධ්‍යක්ෂ ජනරාල් :** | වසන්ත හපුආරච්චි |

| | | |
|---|---|---|
| **අභියාචක** | - | චාමර සම්පත් |
| **නොතිසි ලත් පාර්ශවය** | - | නම්කළ නිලධාරි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව |

**පෙනීසිටීම**

| | | |
|---|---|---|
| අභියාචක | - | චාමර සම්පත් |
| | | තරිඳු ජයවර්ධන |
| පොදු අධිකාරිය | - | ටිකිරි කේ ජයතිලක, සහකාර ලේකම් |
| | | පී.කේ.ඕ.එස්.ඩබ්ලිව්. විජේගුණවර්ධන |

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරියේ පළමු ප්‍රතිචාරය මත පදනම්ව අභියාචකගේ බලයලත් නියෝජිත තරිඳු ජයවර්ධන කරුණු දක්වා සිටියේ තොරතුරු ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමෙන්ම ඇඟවෙනුයේ පොදු අධිකාරියෙහි භුක්තියේ අදාළ තොරතුරු ඇති මුත් 1975 අංක 1 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය ක්‍රියාත්මක වීම නිසා එම තොරතුරු හෙළිකිරීම වළක්වා ඇති බවයි. එමනිසා ඔහු සඳහන් කර සිටිනුයේ තම සන්තකයේ අදාළ තොරතුරු නොමැතිය යන පොදු අධිකාරියේ වත්මන් ස්ථාවරය ප්‍රතිවිරුද්ධතාවක් නිරූපණය කරන බවයි.

නීතිය පිළිබඳ ප්‍රශ්නයක් මතුවූයේ නම්කළ නිලධාරී ලෙස පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහලේකම්වරයා නම්කිරීම සහ වත්මන් ප්‍රතිවිරුද්ධතාව පොදු අධිකාරියේ කරුණු දැක්වීම මත නිර්මාණය විය.

මීට ප්‍රතිචාර ලෙස, පොදු අධිකාරිය විසින් සඳහන් කළ සිටියේ 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතියේ 4 (අ) වගන්තිය ප්‍රකාරව සැකපළ කළ තොරතුරුවල භාරකාරීත්වය කථානායකවරයා සතු බවයි. එබැවින් විධිමත් ඉල්ලීමක් මහලේකම්වරයාට නොව කථානායකවරයාට යොමුකළ යුතුය. එසේම, පොදු අධිකාරිය විසින් අවධාරණය කළේ කිසිඳු අවස්ථාවකදී, පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය විසින් කිසිඳු හෝ ලිඛිත නීතියක් යටතේ තම වත්කම් පිළිබඳ ප්‍රකාශ කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වාර්තා/ලේඛන පවත්වාගැනීමට බැඳීමක් නොමැති බවයි. පොදු අධිකාරිය සඳහන් කරනුයේ කථානායකවරයා හා පාර්ලිමේන්තු මහ ලේකම්වරයා යනු එකිනෙකට වෙනස් ස්වාධීන දේහයන් ද්විත්වයක් වන අතරම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ආරක්ෂා කිරීමට කථානායකවරයා හොඳ සූදානමකින් සිටින බවයි.

නියෝගය:

මෙම අභියාචනයේ සන්දර්භය තුළ පැන නැගී ඇති පැහැදිලි නීතිමය ගැටලුවක් තිබේ. 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධිත ලෙස) නීතිය යටතේ මෙම තොරතුරු ලබාගත හැකි බව පොදු අධිකාරියේ ස්ථාවරය වේ. කෙසේවෙතත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතින් ස්වාධීනව නැගී සිටින වෙනම අයිතිවාසිකමක්ය යන තර්කයට අමතරව, 1975 අංක 01 දරණ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ (සංශෝධිත ලෙස) නීතිය මඟින් අභියාචක විසින් ඉල්ලා ඇති පරිදි සංඛ්‍යාත්මක දත්ත ලබගැනීමේ අයිතියක් ලබා නොදේ. එබැවින්, අභියාචක හට එම නීතිය යටතේ කිසිඳු ප්‍රතිකර්මයක් නොමැත.

තවදුරටත්, මෙම කොමිෂන් සභාව බලපැවැත්වෙන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුව ප්‍රශ්නගත පොදු අධිකාරිය (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව) විසින් මහලේකම් කාර්යාලය තොරතුරු නිලධාරී හා නම්කළ නිලධාරී ලෙස අදාළ නිලධරයා/නිලධාරීන් හා බලතල දරණ අධිකාරී ලෙස නම්කර ඇත. කථානායක කාර්යාලය යනු එලෙස නිලධාරීන් අයත්වන නම්කළ කාර්යාලයක් නොවන බවයි.

මහලේකම් කාර්යාලයේ කරුණු දැක්වීම මත බලන කළ එනම් කාර්යාල ද්විත්වය (මහලේකම් කාර්යාලය හා කථානායක කාර්යාලය) පාර්ලිමේන්තු ව්‍යුහය තුළ සම්පූර්ණයෙන් එකිනෙකට වෙනස් වන අතර ඉල්ලුම් කරන ලද තොරතුර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව මහලේකම් කාර්යාලයේ භාරයේ, සන්තකයේ හා පාලනයේ නොමැති අතර පැන නගින්නාවූ ගැටලුව වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට අවිවාදාත්මක තීරණාත්මක වැදගත්කමක් ඇති මෙවැනි තොරතුරු ලබාගැනීමට අභියාචක හෝ මේ හා සමාන පුරවැසියෙකු යා යුත්තේ කවරෙකු වෙතද යන්නයි?

අභියාචක විසින් සිදුකර ඇත්තේ ප්‍රතිචාර දැක්විය යුතු සාධාරණ ඉල්ලීමක් වන අතර මෙහි දක්වා ඇති ප්‍රායෝගික ගැටලුව සම්බන්ධයෙන් කථානායකවරයාගෙන් උපදෙස් ලබාගන්නා ලෙස පොදු අධිකාරියෙන් ඉල්ලා සිටී.

මෙකී අරමුණ සඳහා මීලග අභියාචනා විභාගය 2019.10.08 වන දිනට කල්තබනු ලැබේ.

*******

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/719/2018 (2019.10.08 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන්

**අධ්‍යක්ෂ ජනරාල් :** වසන්ත හපුආරච්චි

**අභියාචක** - චාමර සම්පත්
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

**පෙනීසිටීම**
අභියාචක - චාමර සම්පත්
තරිඳු ජයවර්ධන
පොදු අධිකාරිය - ටිකිරි කේ ජයතිලක, සහකාර ලේකම්
පී.කේ.ඩී.එස්.ඩබ්ලිව්. විජේගුණවර්ධන

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

සිය පූර්ව කරුණු දැක්වීමම නැවතත් දක්වමින් පොදු අධිකාරිය විසින් සඳහන් කරන ලද්දේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය යටතේ අදාළ ප්‍රකාශන කථානායකවරයාට යොමුකළ යුතු බවයි. එම ප්‍රකාශනවල සන්තකය පවත්නා ස්ථානය පිළිබඳ මහලේකම් කාර්යාලය දැනුවත් වුවද එහි පාලනය ඇත්තේ කථානායකවරයා සතුව වන බවයි.

පොදු අධිකාරිය විසින් පෙර අවස්ථාවන්හිදී මෙන් තවදුරටත් සඳහන් කළේ කථානායක කාර්යාලය හා මහලේකම් කාර්යාලයෙන් වෙන ඇති බවත් මෙම ස්ථාවරය තහවුරු කිරීමට වෙනම කාර්යාලයක් පිහිටුවීම සඳහා කථානායකවරයාට වෙනම වැය ශීර්ෂයක් යටතේ වෙනමම මුදල් වෙන්කිරීමක් සිදුකර ඇති බවට කරුණු දක්වන ලදි. පොදු අධිකාරිය සඳහන් කළේ වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය අනුව ඉල්ලා ඇති තොරතුරු

සංඛ්‍යාත්මක ලෙස පවත්වාගෙන යාමට හා ලබාදීමට කථානායකවරයාට නියමයක් නොමැති බවත් එසේම මහලේකම් කාර්යාලය විසින්ද එවැනි සංඛ්‍යාත්මක තොරතුරු සම්පාදනයක් සිදුනොකරන බවත්ය.

මීට ප්‍රතිචාර ලෙස අභියාචකගේ නියෝජිතයා කරුණු දක්වා සිටියේ පොදු අධිකාරිය විසින් කථානායක කාර්යාලය මහලේකම් කාර්යාලයෙන් වෙනමම වූ ආයතනයක් ලෙස පවත්වාගෙන යන්නේ නම් එවිට ගාස්තු හා අභියාචන කාර්යපටිපාටීන් පිළිබඳ තොරතුරු දැනගනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ රීතින්හි 4(6) රෙගුලාසිය යටතේ අදාළ ඉල්ලීම යොමු කිරීමට බැඳියාවක් පවතින බවයි. (ගැසට් අංක 2004/66, 2017.02.03) කෙසේවෙතත් මෙම අවස්ථාවේදී එය එසේ සිදු නොවීය.

මෙම අවස්ථාවේදී පොදු අධිකාරිය හා/හෝ ගරු කථානායකවරයා විසින් මෙම කාර්යාල ද්විත්වයේ වෙනස්කම පිළිගැනීමට අවශ්‍ය වන්නේ නම්, ඉල්ලා ඇති සංඛ්‍යාත්මක තොරතුරුවල ස්වභාවය අනුව සාධාරණ උත්සාහයකින් යුතුව ඉල්ලා සිටි තොරතුරු සැපයිය හැකිය.

නියෝගය:

මෙම කාරණය සම්බන්ධයෙන් මීට පෙර වූ අභියාචනා විභාගයේදී පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලය නියෝජනය කරමින් සහභාගී වූ නිලධාරීන් විසින් අභියාචක වෙත ලබාදුන් උපදෙස වන වත්කම් හා බැරකම් ප්‍රකාශන නීතිය යටතේ අදාළ තොරතුරු ලබා ගැනීමට ඉල්ලීමක් කරන ලෙස සැලකිරීම සිදුකළ නොහැක්කක් වන්නේ එම නීතිය යටතේ අභියාචක විසින් විමසන ලද සංඛ්‍යානමය ස්වභාවයේ තොරතුරු ලබාගැනීමට පහසුකම් සපයන නීතියක් නොවන බැවිණි.

දෙවනුව, මෙම කොමිෂන් සභාව විසින් මීට පෙරාතුව පවා තීරණය කරන ලද්දේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ නීතිය අභිබවා තොරතුරු පනත බලාත්මක වන බවයි. (RTIC/Appeal/06/2017 - ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා එ. ජනාධිපති ලේකම් කාර්යාලය, 2018.12.10 දිනැති නියෝගය)

පාර්ලිමේන්තුවේ විනිවිදභාවය තහවුරු කිරීමේ වැදගත් අංගයක් වන මෙම තොරතුරුවලට අදාළව කිසිඳු ප්‍රතිකර්මයක් නොමැතිව අභියාචකව පිටත් කිරීමකට ඉඩ නොසලසමින් තොරතුරු නිලධාරියා/නම්කළ නිලධාරියා විසින් මේ පිළිබඳව කථානායකවරයා සමඟ සාකච්ඡා කර එහි තීරණය කොමිෂන් සභාවට දැනුම්දීමට මෙයින් නියම කෙරේ. මෙම නියෝගය නැවත නැවතත් අවධාරණය කර සිටී.

අප ඉදිරියේ ඇති ගැටලුව වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නිශ්චිත වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශයන් නොව ඒ පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු සම්පාදනය කිරීමක් පිළිබඳව වේ. එබැවින්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ පත්කර ඇති තොරතුරු නිලධරයා/නම්කළ නිලධරයා විසින් නිශ්චිත සංඛ්‍යාත්මක තොරතුරු ලෙස අභියාචක ඉල්ලා ඇති තොරතුරු පොදු අධිකාරියෙන් (ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව) ලබාගත හැකිද යන්න පිළිබඳව හා/හෝ 27(2) වගන්තිය සමඟ කියවිය යුතු තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ රීති හා රෙගුලාසි පිළිබඳ 7 වන නියමයේ 4 වන රෙගුලාසිය (2017.02.03 දිනැති අංක 2004/66 අති විශේෂ ගැසට් පත්‍රය) ප්‍රකාරව එම තොරතුරු ලබාදීමට හැකිද යන්නත් පැහැදිලි කිරීමට මින් නියම කර සිටී.

අභියාචනය මින් කල්තබනු ලැබේ.

මීලඟ අභියාචනා විභාගය 2019.10.22

*******

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/719/2018 (2019.10.22 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

| | |
|---|---|
| **සභාපති:** | මහින්ද ගම්මම්පිල |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන |
| **කොමිෂන් සභා සමාජික:** | ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා |
| **කොමිෂන් සභා සමාජික:** | ආචාර්ය සෙල්වි තිරුචන්ද්‍රන් |
| **අධ්‍යක්ෂ ජනරාල් :** | වසන්ත හපුආරච්චි |

| | | |
|---|---|---|
| **අභියාචක** | - | චාමර සම්පත් |
| **නොතිසි ලත් පාර්ශවය** | - | නම්කළ නිලධාරි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව |

**පෙනීසිටීම**

| | | |
|---|---|---|
| අභියාචක | - | චාමර සම්පත් |
| | | තරිඳු ජයවර්ධන |
| පොදු අධිකාරිය | - | ටිකිරි කේ ජයතිලක**,** සහකාර ලේකම් |
| | | පී.කේ.ඩී.එස්.ඩබ්ලිව්. විජේගුණවර්ධන |

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය පවසා සිටින ලද්දේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ 2019.10.08 දිනැති නියෝගය ගරු කථානායකවරයා සමග සාකච්ඡා කිරීමෙන් පසුව, කථානායකතුමාගේ ඉල්ලීම වුයේ මේ සම්බන්ධව තොරතුරු කොමිෂන් සභාව තමා හා සෘජුව කතා කළ යුතු බවයි. පොදු අධිකාරිය නැවත වරක් පවසා සිටියේ පාර්ලිමේන්තු වරප්‍රසාද වලට බලපෑම් ඇති වන බැවින් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලිකත්වයට බලපාන බැවින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත (තොරතුරු පනත) යටතේ තොරතුරු ලබා නොදිය හැකි බවයි.

මෙයට ප්‍රතිචාරයක් ලෙස අභියාචක වෙනුවෙන් කරුණු දක්වන ලද තරිඳු ජයවර්ධන මහතාගේ තර්කය වුයේ අදාළ පොදු අධිකාරියෙහි අභ්‍යන්තර පරිපාලනමය සලස්මන් අභියාචකයාගේ තොරතුරු ඉල්ලීමට අදාළ නොවන බවත් පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය වන බව පවසා සිටියද එය සිදුවන්නේ කෙසේද හෝ කවර පාර්ලිමේන්තු වරප්‍රසාදයක් උල්ලංඝනය වන්නේ දැයි පැහැදිලි නොවන බවත්ය.

පොදු අධිකාරියෙහි ප්‍රතිචාරය වුයේ මෙම විරෝධතාවය වන පාර්ලිමේන්තු වරප්‍රසාද යන්න පොදු සහ පරිපූර්ණ ලෙස අර්ථකථනය කළ යුතු බවයි.

නියෝගය:

පොදු අධිකාරිය විසින් තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට අදාළ විරෝධතා කොමිෂන් සභාව විසින් සලකා බලා ඇත. පොදු අධිකාරිය විසින් වාද කර සිටිනුයේ පාර්ලිමේන්තු ව්‍යුහය ගත් කළ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය සහ පාර්ලිමේන්තු කථානායකවරයාගේ කාර්යාල දෙක, එකිනෙකින් වෙන්වූ සහ වෙනස් වූ කාර්යාල දෙකක් වන අතර

මහ ලේකම්තුමා වත්කම් හා බැරකම් ප්‍රකාශ කථානායකවරයා සමග පවතින්නේ කොතැනකද යන්න පිළිබඳව 1975 වත්කම් හා බැරකම් පනතේ 4 (ආ) වගන්තිය ප්‍රකාරව දැනුවත්ව සිටියද මෙම දැනුම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 (1) වගන්තිය ප්‍රකාරව සන්තකය, භාරය හෝ පාලනය යන අර්ථනිරූපනය යටතට ගත නොහැකි බවයි. තවද වාද කර සිටියේ තොරතුරු කථානායකවරයාගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ පවතින බවත් ය.

මෙම අවස්ථාවේ උද්ගතව ඇති ප්‍රශ්නය වන, තොරතුරු පනතේ 3 (1) වගන්තිය ප්‍රකාරව, මහ ලේකම් කාර්යාලය සන්තකයේ, භාරයේ හෝ පාලනයේ අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු පවතින්නේද යන්න, මෙම කොමිෂන් සභාව විසින් එහි අවසන් නියෝගය මගින් නිර්ණය කළ යුතුව ඇත. මහ ලේකම් කාර්යාලය විසින් සිදු කරන ලද ඉල්ලීම, එනම් මෙම අභියාචනය සහ ඒ සම්බන්ධයෙන් උද්ගතව ඇති සාමගාමී ප්‍රශ්නයන් ගරු කථානායකවරයා වෙත දැනුවත් කිරීම, ප්‍රකාරව මෙම නියෝගය මහ ලේකම් කාර්යාලය හරහා, ගරු කථානායකවරයාගේ කාරුණික අවධානය පිණිස, කථානායකවරයාගේ කාර්යාලය වෙත යොමු කිරීමට නියෝග කරනු ලැබේ.

පොදු අධිකාරිය විසින් ගෙන ඇති විරෝධතා ගත් කළ, එනම් පනතේ 5 (1) (අ) සහ 5 (1) (k) වගන්ති ප්‍රකාරව තොරතුරු මුක්ත තොරතුරු යන්න, පහත පරිදි වේ.

පනතේ 5 (1) (අ) වගන්තිය ප්‍රකාරව තොරතුරු මුක්ත තොරතුරු වන්නේ,

> *පුද්ගලික තොරතුරුවලට අදාළ තොරතුරු සම්බන්ධයෙන් වන විට, තොරතුරු හෙළිදිරව් කරීම යම් පොදු කටයුත්තකට හෝ සම්බන්ධතාවක් සඳහා කිසිදු සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී හෝ යම් තනි පුද්ගලයකුගේ පුද්ගලිකත්වය අනවසරයෙන් ආක්‍රමණය කිරීමක් සිදුවේ නම්, එම තොරතුරු හෙළිදරව් කිරීම විශාල වශයෙන් මහජන සුභසිද්ධිය විසින් සාධාරණීකරණය කරයි නම්, හෝ අදාළ තැනැත්තා විසින් එම හෙළිදරව් කිරීම සඳහා ලිඛිතව කැමැත්ත ලබා දී ඇත්නම් මිස*

කොමිෂන් සභාව විසින් ගෙන ඇති පෙර තීරණ අනුව (තරිඳු ජයවර්ධන එ. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය RTIC Appeal/119/2017 2019.01.22 දිනැති නියෝගය) 5 (1) (අ) වගන්තිය ප්‍රකාර විරෝධතාවයක්, සංඛ්‍යාලේඛන සම්බන්ධ තොරතුරු ඉල්ලීමක් වන අවස්ථාවකදී, පුද්ගලික තොරතුරු ඇතුළත් නොවන බැවින්, තොරතුරු ඉල්ලීමෙහි අයිතම 1ට අදාළව පවත්වාගෙන යා නොහැකිය.

තවද මෙම අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගේ වත්කම් හා බැරකම් සම්බන්ධ තොරතුරු හෙළිදරව් කිරීම ඉතා ඉහළ මහජන සුභසිද්ධියක් දරන කටයුත්තකි. ඒ අනුව පොදු අධිකාරිය විසින්, 5 (1) (අ) සහ 5 (4) වගන්තියන්හි සඳහන් මහජන සුභසිද්ධිය අභිභවා සිදුවන හානිය, තහවුරු කළ යුතු වේ.

පොදු අධිකාරියෙහි දෙවැනි විරෝධතාවය වුයේ 5 (1) (ඔ) වගන්තිය ප්‍රකාරවය. 5 (1) (ඔ) වගන්තිය ප්‍රකාරව '... තොරතුරු හෙළිදරව් කිරීම පාර්ලිමේන්තු වරප්‍රසාද හෝ නීතිය මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පළාත් සභා වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් වන අවස්ථාවක දී' තොරතුරු මුක්ත තොරතුරු වේ.

මෙම විරෝධතාවය පොදු අධිකාරියෙහි 2019.05.21 දිනැති ලිඛිති දේශනා මගින් පිළිබිඹු වේ.

> *12. ව්‍යවස්ථාවේ, 14අ (2) ව්‍යවස්ථාව ප්‍රකාරව පුරවැසියෙකුගේ තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම පාර්ලිමේන්තු වරප්‍රසාද සුරකීම සඳහා සීමා කල හැකිය.*
> *13. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3 (2) වගන්තිය මෙම සීමා කිරීම පුළුල් කොට ඇති අතර එහි සඳහන් වන පරිදි පනතේ විධිවිධාන පාර්ලිමේන්තු බලතල, වරප්‍රසාද සහ පරිචයන් හීන කරනු නොලබන්නේ ය.*

*14. පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනත ව්‍යවස්ථාවේ, 67 ව්‍යවස්ථාව සමග සම්බන්ධ කොට ඇති අතර එහි සඳහන් වන්නේ*

> *පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නිශ්චය කොට විධිමත් කළ හැකි අතර, එසේ නිශ්චය කොට විධිමත් කරන තෙක් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතෙහි විධිවිධාන, අවශ්‍යවෙනස් කිරීම් සහිතව, ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.*

කෙසේ වුවද මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටින්නේ මෙම ඡේදයන් මගින්, වත්කම් හා බැරකම් නීතිය (1975) යටතේ, වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීන් සංඛ්‍යාව හෙළිදරව් කිරීම මගින්, 'වරප්‍රසාද' උල්ලංඝනයට ලක්වන බව දක්වා නොමැති බවයි. වරප්‍රසාද යන වචනය *එර්ස්කින් මේ, පාර්ලිමේන්තු නීතිය, වරප්‍රසාද, කර්යයපටිපාටිය සහ භාවිතයන් (1844)* නම් නිබන්ධනයෙහි *(Erskine May's Treatise on the Law, Privileges, Proceedings and Usage of Parliament (1844))* අර්ථනිරූපනය කර ඇති අතර එය පහත පරිදි වේ;

> *පාර්ලිමේන්තු වරප්‍රසාද යනු සභාවක් විසින් සාමුහිකව භුක්ති විඳින සුවිශේෂී අයිතිවාසිකම් වල එකතුවක්... සහ සභාවෙහි එක් එක් සාමාජිකයා විසින් තනිව භුක්ති විඳින අයිතිවාසිකම් වන අතර මෙම අයිතිවාසිකම් ඇතිව විනා තම කාර්යයන් ඉටු කළ නොහැකි සහ අනෙකුත් ව්‍යුහයන් හෝ පුද්ගලයින්ට ඇති අයිතිවාසිකම් අභිබවා පවතින්නකි.*

මෙවැනි තත්ත්වයන් හමුවේ, ඉල්ලා ඇති සංඛ්‍යාලේඛන නිදහස් කිරීම මගින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ කවර 'සුවිශේෂී අයිතිවාසිකමක්' උල්ලන්ඝනය වන්නේ දැයි පැහැදිලි නොවේ. මෙමගින් ලබා දී ඇති වරප්‍රසාද පාර්ලිමේන්තු සභා ගැබෙහි විශේෂ කාර්යයන් සිදු කිරීම සඳහා ලබා දී ඇත. මෙම වරප්‍රසාද සහ අභියාචක ඉල්ලා ඇති සංඛ්‍යාලේඛන ලබා දීම අතර ඇති සම්බන්ධතාවය අපැහැදිලිය. වරප්‍රසාද උල්ලංඝනය වන්නේ කෙසේද හෝ කවර ආකාරයකින්ද යන්න පොදු අධිකාරිය පැහැදිලි කර නැත.

තවද වත්කම් හා බැරකම් පනත (1975) යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීන් විසින් තම වත්කම් හා බැරකම් ප්‍රකාශ කථානායකවරයා වෙත ලබා දීම නෛතික යුතුකමකි. ඒ අනුව මෙම තොරතුරු ඉල්ලීම මගින් කෙතරම් දුරට නීතියට අනුකූලවී ඇත්ද යන්නට ද අදාළ වේ.

තොරතුරු පනත ප්‍රකාරව ස්ථාපිත කර ඇති මෙම කොමිෂන් සභාවෙහි ස්ථාවරය වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ඇතුළත් 'පොදු අධිකාරිවල විනිවිදභාවය සහ වගකීම පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම' අවධාරණය කරන අතර, පනතෙහි 4 වගන්තිය ප්‍රකාරව වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත් ද, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු බවද අවධාරණය කරනු ලැබේ. කෙසේ වුවද මෙම අභියාචනයෙහි ඉල්ලා ඇති සංඛාලේඛන, වත්කම් හා බැරකම් පිළිබඳ පනත (1975) යටතේ ඉල්ලා සිටිය නොහැකිය. ඒ අනුව සහ තොරතුරු පනත වත්කම් හා බැරකම් පනත අභිභවා බලපැවැත්වේය යන ස්ථාවරයට අගතියක් නොවන සේ, පොදු අධිකාරියෙහි තර්කය පිළිගන්නේ නම්, අභියාචක වෙත මෙම තොරතුරු (සංඛ්‍යාලේඛන) ලබා ගැනීමට කිසිදු පිළියමක් නොමැති වන අතර, මෙය 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ස්ථාපනය කිරීමට උත්සාහ දරන තොරතුරු තන්ත්‍රය පුළුල් සේ ප්‍රතික්ෂේප කිරීමකි .

දෙපාර්ශ්වයටම මීළඟ දිනට පෙර ලිඛිත දේශනා ගොනු කළ හැකිය.

**මීළඟ විභාග වාරය**: 2019.11.05

*****